## අඟහරුවාදා

පළමුවන කියැවීම රෝම 8: 18–25

ශුද්ධ වූ පාවුළු තුමන් විසින් රෝමවරුන් වෙත යවන ලද හසුනෙන් කොටසකි.

මේ මුළු සක්වල වූ ද දේව පුත්‍රයාණන්ගේ පහළවීම අධික ආශාවෙන් පුල පුලා බලා සිටී.

"මේ ජීවිතයේ දුක් වේදනා, අපට මතු එළිදරව් වන්නට යන මහිමය සමග කිසිසේත් සැසඳිය නොහැකි ය" යි කල්පනා කරමි. මවා ඇති මේ සක්වළ වුව ද දේව පුත්‍රයාණන්ගේ පහළවීම අධික ආශාවෙන් පුල පුලා බලා සිටියි. මන්ද, විශ්වය ශූන්‍යතාවයට යටත් කළ තැනැත් වහන්සේ එසේ කළේ විශ්වයේ කැමැත්තෙන් නොව එසේ යටත් කළ උන්වහන්සේගේ ම බලාපොරොත්තු සහගත කැමැත්තෙනි. ඒ බලාපොරොත්තුව නම් මවා ඇති මේ විශ්වය ජරාපත් වීමේ වහල් කමෙන් මිදී දේව දරුවන්ට හිමි මහිමාන්විත නිදහස ලැබීම ය. මවා ඇති මුළු විශ්වය මේ දක්වා ම ප්‍රසව වේදනාවෙන් කෙඳිරිගානා බව අපි දනිමු. එපමණක් නොව, ආත්මයාණන් වහන්සේ කෙරෙන් වන දීමනාවේ තාඹුල් එල ලැබූ අපි ද, අපේ කායික මිදීම වන, පුත්‍රකමට පිළිගනු ලැබීමේ බලාපොරොත්තුවෙන් අප තුළම සුසුම් ලමු. අප ගැළවීම ලබා ගත්තේ බලාපොරොත්තුව කරණකොටගෙනය. පෙනෙන දේ ගැන බලාපොරොත්තුව, බලාපොරොත්තුවක් නොවේ. පෙනෙන දෙයක් ගැන බලාපොරොත්තු වන්නේ කුමටද? එහෙත් අපි නොපෙනෙන දෙයක් බලාපොරොත්තු වෙමු නම්, එය ඉවසිල්ලෙන් යුතුව බලා සිටිමු.

දේව වචනය මෙසේ ය.

පිළිතුරු ගීය ගීතාවලිය 126: 1–6

පිළිතුර : සමිඳාණෝ ඉමහත් දේ කළ සේක.

ගීය : සමිඳුන් අප මුදා සියොනට ගෙනා කල, අපට එය සිහිනයක් මෙන් විය.
එවිට අපි සිනාවෙන් ඉපිලී ගියෙමු. ප්‍රීතියෙන් ගී ගායනා කළෙමු.

"සමිඳාණෝ මොවුන් උදෙසා ඉමහත් දේ කළ සේකැ" යි විජාතීහු කියන්නට ගත්හ.
සමිඳාණෝ අප උදෙසා ඉමහත් දේ කළ සේක. එබැවින් අපි සන්තෝෂ වමු.

සමිඳුනි, අපේ සිරකරුවන් දකුණු දිශාවේ ගලා යන ඇළ දොළ මෙන්
අපට යළි ගෙන දුන මැනව.
දුකින් කෙත වපුරන්නෝ තුටින් අස්වැන්න නෙළා ගන්නෝ ය.

ඔවුහු වී මළු රැගෙන කඳුළු සල සලා පිටත් ව ගිය නමුත්,
නම ගොයම් මිටි රැගෙන ප්‍රීතියෙන් පින පිනා ආපසු ආහ.

සුපුවත් ජය නද පුවාම් 15:15

ආලේලූයා! ආලේලූයා!
"ඔබ මාගේ මිතුරෝ ය. මන්ද, මාගේ පියාණන් වහන්සේගෙන්
මා ඇසූ සියල්ල ම ඔබට දන්වා වදාළ බැවින් ය" යි
සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

නොහොත්

සාධුකාරය මතෙව් 11: 25

ආලේලූයා! ආලේලූයා!
ස්වර්ගයටත් පොළොවටත් ස්වාමින් වන පියාණන් වහන්ස,
දේව රාජ්‍යය පිළිබඳ අභිරහස් භූදෙක් බාලයන්ට අනාවරණය කළ හෙයින්
ඔබට තුති වේවා!
ආලේලූයා!

සුවිශේෂය ලූක් 13: 18-21

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

අබ ඇටය වැඩී මහා ගසක් වෙයි.

ජේසුස් වහන්සේ තවදුරටත් කතා කරමින්, "දෙවියන් වහන්සේගේ රාජ්‍යය කුමකට සමාන ද? එය කුමකට උපමා කරම් ද? එක්තරා මිනිසෙකු තම වත්තෙහි රෝපණය කළ පසු වැඩී, මහ ගසක් වූ අබ ඇටයකට එය සමාන ය. අහසේ කුරුල්ලෝ අවුත් එහි අතු පතරෙහි ලැගුම් ගත්හ" යි වදාළ සේක.

යළිදු උන් වහන්සේ කතා කොට, "දෙවියන් වහන්සේගේ රාජ්‍යය කුමකට උපමා කරම් ද? ස්ත්‍රියක විසින් පිටි නැළි තුනක් මුළුමනින් ම පිපෙන තෙක් එහි දමන ලද මුහුන් පිඩකට එය සමාන ය" යි වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.